# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.07.07 පැය 0110 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1117/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මීගමුව බන්ධානාගාරය තුල ඇති වූ කළහකාරී තත්ත්වය සම්බන්ධව.**

2026.07.05 දින මීගමුව බන්ධනාගාරය තුලදී මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ පිරිසක් හා මත්ද්‍රව්‍ය ජාවාරමට විරෝධය දක්වන රැඳවියන් පිරිසක් අතර කළහකාරී තත්ත්වයක් ඇති වී ඇත. ඒ හේතුවෙන් දෙපාර්ශවයේම රැඳවියන් තුවාල ලබා මීගමුව රෝහලට ඇතුලත් කර ඇති අතර ඉන් රැඳවියන් දෙදෙනෙකු මියයාම සම්බන්ධයෙන් මීගමුව පොලිස් ස්ථානය මඟින් විමර්ශන ආරම්භ කර ඇත. එසේම එම සිද්ධිය හේතුවෙන් බන්ධනාගාරය අවට ආරක්ෂාව තර කිරීමටද පොලිසිය කටයුතු කර ඇත.

2026.07.06 දින නැවතත් බන්ධනාගාර නිලධාරින් රාජකාරි නිරතව සිටියදී බන්ධනාගාර නිලධාරින්ගේ රාජකාරියට බාධා කර පහරදීම හේතුවෙන් නැවත ගැටුමක් ඇති වී ඇති අතර එම ගැටුම උත්සන්න වී බන්ධනාගාර නිලධාරීන් හා රැඳවියන් තුවාල ලබා රෝහල් ගත කර ඇති අතර එම ගැටුමෙන් නිලධාරින් හා රැඳවියන් පිරිසක් මරණයට පත්ව ඇත.

එම කළහකාරී තත්ත්වය පාලනය කර ගැනීම සඳහා බන්ධනාගාර නිලධාරින් කරන ලද ඉල්ලීම අනුව පොලිසිය සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරින් බන්ධනාගාර නිලධාරින් හට ගැටුම පාලනය කර ගැනීමට අවශ්‍ය සහය ලබාදෙන ලදී. ඒ අනුව බන්ධනාගාරය තුල ඇති වී තිබූ කළහකාරී තත්ත්වය පාලනය කර ඇත.

බන්ධනාගාර නිලධාරින් විසින් රැඳවියන් 700 ක් පමණ වෙනත් බන්ධනාගාර වෙත ආරක්ෂාව සඳහා මාරුකර යැවීමට පියවර ගෙන ඇති අතර ඒ සඳහා අවශ්‍ය ආරක්ෂාව ලබා දීමට පොලිසිය කටයුතු කර ඇත.

මෙම කළහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර මීගමුව පොලිස් ස්ථානය හා කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශන සිදු කරන අතර ඉදිරි විමර්ශන කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**